දුරකථනය
தொலைபேசி
Telephon 011-2478373, 011-2573429
email dcoopdev@sltnet.lk
Web www.coop.gov.lk

ෆැක්ස්
பெக்ஸ்
Fax 011-2478386

විදුලි පණිවුඩ / தந்தி / Telegrams
සමුපකොම
கூட்டுறவு
CREDIT

මගේ අංකය
எனது இல
My No 4/2/ගා/බැ/පොද

ඔබේ අංකය
உமது இல
Your No

දිනය
திகதி
Date 2013.08. 06


# සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

තැ.පෙ. 419, නො: 330, යූනියන් පෙදෙස, කොළඹ-02

கூட்டுறவு அபிவிருத்தித் திணைக்களம்
த.பெ. 419, இல 330,
யூனியன் ப்ளேஸ், கொழும்பு – 02

DEPARTMENT OF CO-OPERATIVE DEVELOPMENT
P.O.Box419, No – 330,
Union Place, Colombo - 02


සියළුම පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්වරුන් වෙත,

**සමුපකාර ග්‍රාමීය බැංකුවල සහ සමුපකාර මූල්‍ය සේවා සමිතිවල ද්‍රවශීලතාවය පවත්වා ගැනීම**

සමුපකාර ග්‍රාමීය බැංකු සහ මූල්‍ය සේවා සමුපකාර සමිතිවල මූල්‍ය ස්ථාවරත්වය කෙරෙහි ඉතා අයහපත් ලෙස බලපා ඇති කරුණක් නම් ඒවායේ ද්‍රවශීලතාවය ඉතා අර්බුදකාරී තත්ත්වයක පැවතීමයි. අප වෙත ලැබී ඇති දත්තයන් අනුව ඇතැම් දිස්ත්‍රික්කයන්හි සමුපකාර ග්‍රාමීය බැංකුවල ද්‍රවශීල වත්කම්වල අගය තැන්පතුවල ප්‍රතිශතයක් ලෙස ගණනය කළ විට එය 2% ටත් වඩා අඩු අගයක් ලෙස පවතී. මෙය ඉතා අවදානම් සහගත තත්වයක් බව අවධාරණය කරමි.

මූල්‍ය ස්ථාවරත්වය පළුදු වී ඇති සමුපකාර ග්‍රාමීය බැංකු සහ මූල්‍ය සේවා සමුපකාර සමිතිවල ස්ථාවරත්වය යලි ගොඩනැංවීමේ මූලික පියවරක් ලෙස ඒවායේ ද්‍රවශීලතාව ශක්තිමත් කිරීම අත්‍යාවශ්‍ය වී තිබේ. මේ සඳහා සමුපකාර සමිති මට්ටමින් මෙන්ම සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු මට්ටමෙන් විශාල කාර්යභාරයක් ඉටු කිරීමට තිබේ. විවිධ අවස්ථාවන්හිදී ද්‍රවශීලතාවය පවත්වා ගැනීම සම්බන්ධයෙන් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් උපදෙස් දී ඇතත් ඒවා නිසි පරිදි අනුගමනය නොකෙරෙන පසුබිම තුල 2013 ජූලි මස 09 වෙනි දින රැස්වූ සමුපකාර ග්‍රාමීය බැංකු සහ සමුපකාර මූල්‍ය සේවා සමිති පිළිබඳ ජාතික නියාමන කමිටුව විසින් එම සමිති විසින් පවත්වාගත යුතු ද්‍රවශීලතා අවශ්‍යතාවයන් පිළිබඳ උපදෙස් නිකුත් කිරීම අනුමත කල අතර එම උපදෙස් පත්‍රිකාවේ පිටපතක් සහ ද්‍රවශීලතාව ගණනය කිරීමේ උපදෙස් අඩංගු පත්‍රිකාවක් මෙයට යාකර ඇත. මෙම උපදෙස් ඉතා කඩිනමින් ඔබ බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක කිරීමට සහ ඊට අනුගතවීම නියාමනය කිරීමට කටයුතු කරන මෙන් ඉල්ලා සිටිමි.

ඩබ්ලිව්.එච්. කරුණාරත්න,
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්

සියළුම පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්වරුන් වෙත,

2013 ජූලි මස 09 දින රැස් වූ සමුපකාර ග්‍රාමීය බැංකු හා මූල්‍ය සේවා සමිති පිළිබඳ ප්‍රධාන නියාමන කමිටුව විසින් ගන්නා ලද තීරණය පහත දැක්වේ.

අදාල සමුපකාර ආයතන මෙම උපදෙස් වලට අනුකූලව කටයුතු කල යුතුය.

<u>නියාමන උපදෙස් අංක 01</u>

## <u>ද්‍රවශීල වත්කම් පවත්වාගැනීමේ අවශ්‍යතාවය</u>

ඉතුරුම් හා ස්ථාවර තැන්පතු ලබා ගැනීමේ කාර්යයෙහි යෙදී සිටින සෑම සමුපකාර ආයතනයක්ම පහත සඳහන් ප්‍රතිශතයන්ට අනුකූලව ද්‍රවශීල වත්කම් පවත්වාගත යුතුය.

අ. 1. ඉකුත් මස අවසන් වැඩ කරන දින පැවති සියලුම ඉතුරුම් තැන්පතුවල අගයෙන් 15% වනසේ

2. ඉකුත් මස අවසන් වැඩ කරන දින පැවති සියලුම ස්ථාවර තැන්පතුවල අගයෙන් 10% වනසේ

3. ආයතනයේ මුළු කල්පසුවූ ණය මුළු ණය කළඹෙන් 1%ට වඩා අඩුවන අවස්ථා වලදී ඉතුරුම් තැන්පතු වලින් 10% වනසේද ස්ථාවර තැන්පතු වලින් 7 %ක් වන සේද ද්‍රවශීල වත්කම් පවත්වා ගැනීමට අවකාශ ලැබේ.

ආ. සෑම දිනකම මෙහෙයුම් අවසන් කරන අවස්ථාවේ මෙම අවශ්‍යතාවයට අනුකූලවන පරිදි ද්‍රවශීල වත්කම් පවත්වාගත යුතුය.

ඇ. සෑම සතියකම අවසාන වැඩ කරන දිනයේ පවතින ද්‍රවශීල වත්කම් පිළිබඳ වාර්තාවක් මීට යා කර ඇති ආකෘතියට අනුව පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් වෙත වැඩ කරන දින 03ක් ඇතුලත ඉදිරිපත් කළ යුතුය.

ඈ. ද්‍රවශීල වත්කම් ලෙස ඇතුලත් කල යුතු වන්නේ පහත සඳහන් වත්කම් වල අදාල කාලයේ පැවති සාමාන්‍ය අගයයි.

- අදාල සමුපකාර කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් ගේ නිර්දේශය මත පළාත් නියාමන කමිටුව විසින් ලිඛිතව අවසරය දෙන ලද සමුපකාර සමිතියක තැන්පතු.
  මෙම අවසරය දීමේ දී අදාල නියාමන කමිටුවට අවශ්‍ය පරිදි සීමාවන් පැනවිය හැකිය. කෙසේ වුව ද එම තැන්පතු ලබා ගන්නා සමුපකාර ආයතනය මෙම උපදෙස් පත්‍රිකාවේ ඇති ද්‍රවශීල අවශ්‍යතාවයන් සපුරාලන ලද ආයතනයක් විය යුතුය.
- අත ඉතිරි මුදල්
- බලපත්‍රලාභී වාණිජ බැංකුවක ඇති ජංගම ගිණුම් ශේෂයන්
- බලපත්‍රලාභී වාණිජ බැංකුවක හෝ විශේෂිත බැංකුවක ඇති ඉතුරුම් ගිණුම් ශේෂයන්
- බලපත්‍රලාභී වාණිජ බැංකුවක හෝ විශේෂිත බැංකුවක ස්ථාවර තැන්පතු ශේෂයන්
- භාණ්ඩාගාර බිල්පත් සහ වර්ෂයකට අඩු කල් පිරීම් සහිත වෙනත් රජයේ සුරැකුම්පත්

ඉ. මෙම වත්කම් හෝ ඉන් කොටසක් සුරැකුම් ලෙස තබා මූල්‍ය ආයතනයකින් ණය පහසුකම් ලබා ඇතිනම් එම සුරැකුම් වශයෙන් තැබූ වත්කම් වල අගය ද්‍රවශීල වත්කම් ලෙස ගණන් නොගත යුතුය.

ඊ. මාසයේ අවසාන සතියේ ද්‍රවශීලතාවය පවත්වා ගැනීම පිළිබඳ දත්තයන් නිවැරදි බවට ආයතනයේ අභ්‍යන්තර විගණක විසින් තහවුරු කල යුතුය.

ඒ. මෙම උපදෙස් මාලාවේ අඩංගු අවශ්‍යතාවය 2013 ඔක්තෝබර් මස 01 දින සිට බලපැවැත්වේ.

ඩබ්ලිව්.එච්. කරුණාරත්න,
සමුපකාර සංවර්ධන කොමසාරිස් හා
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්

කාර සමිතියේ නම :

# ද්‍රවශීලතා වාර්තාව

..... දිනෙන් පටන් ගන්නා සතියේ අවසාන දිනය වන ......... දින ද්‍රවශීලතා තත්ත්වය

( රු. 000 )

| ..................දිනට | මුළු අගය | තිබිය යුතු ද්‍රවශීල තත්වය |
|---|---|---|
| 01. ඉතුරුම් ගිණුම්වල ශේෂයන් | .................. | .................. |
| 02 ස්ථාවර ගිණුම්වල ශේෂයන් | .................. | .................. |
| 03. එකතුව | .................. | .................. |

..................දින සිට ..................දින දක්වා පැවති

ද්‍රවශීල වත්කම්වල සාමාන්‍ය අගය

| | | |
|---|---|---|
| 04. අතැති මුදල් | .................. | |
| 05. වාණිජ බැංකුවක ජංගම ගිණුම් බැර ශේෂ | .................. | |
| 06. වාණිජ බැංකුවක හෝ විශේෂිත බැංකුවක ඉතුරුම් ගිණුම් | .................. | |
| 07. වාණිජ බැංකුවක හෝ විශේෂිත බැංකුවක ස්ථාවර තැන්පත් | .................. | |
| 08. භාණ්ඩාගාර බිල් පත් / රජයේ සුරැකුම් පත් | .................. | |
| 09. පළාත් නියාමන කමිටුවෙන් අනුමත වූ සමුපකාර සමිතියක තැන්පත් | .................. | |
| 10. මුළු ගණන | | .................. |

අතිරික්තය (+) හෝ හිගය (-) ..................

ගණකාධිකාරී

..................

දිනය ..........

බැංකු සේවා කළමණාකරු

..................

දිනය ..........

අදාල කාලයේ වැඩ කළ දින ගණන් වල පැවති ශේෂයන් වල එකතුව / වැඩ කළ දින ගණන

## සමුපකාර ග්‍රාමීය බැංකු සහ සමුපකාර මූල්‍ය සේවා සමිති සඳහා ද්‍රවශීලතාව ගණනය කිරීම සඳහා උපදෙස්

1) ද්‍රවශීලතාව ගණනය කිරීම සඳහා පදනම වශයෙන් ගැනෙන්නේ ඉකුත් මස අවසාන වැඩ කරන දිනයේ පැවති තැන්පත් ගිණුම්වල ශේෂයයි. ජූලි මාසයේ යම් කාල සීමාවක් සඳහා ද්‍රවශීලතාව ගණනය කිරීමට අවශ්‍යනම් ඒ සඳහා ජූනි මාසයේ අවසාන වැඩ කල දිනයේ ශේෂයන් පදනම් කරගත යුතුයි. නිදර්ශනයක් ලෙස 2013 ජූනි මස අවසන් වැඩ කරන දිනය වූ 28 වැනි දින ඉතුරුම් ගිණුම් ශේෂයන් රු.මිලියන 26 ලෙසද ස්ථාවර තැන්පතු ශේෂය මිලියන 50 ලෙසද පැවති බව උපකල්පනය කරමු. එදිනට පැවති ඉතුරුම් ගිණුම්වල මුළු අගයෙන් සියයට 15ක් ද ස්ථාවර ගිණුම්වල අගයෙන් සියයට 10 ක් ද වනසේ ගණනය කර සපයා ඇති ආකෘති පත්‍රයේ අංක 01 සහ 02 යටතේ පිළිවෙලින් ලියන්න. එම දෙකෙහි එකතුව අංක 03 යටතේ පිලිවෙලින් සටහන් කරන්න.

2) ඉන්පසු අදාල කාලය සඳහා පැවති ද්‍රවශීල වත්කම් වල සාමාන්‍ය අගය ගණනය කර බලන්න.

ජූලි මස 01 වැනි දින සිට 05 වැනි දින දක්වා සතිය සඳහා ද්‍රවශීල වත්කම් පහත දැක්වෙන පරිදි පැවති බව සිතමු.

ද්‍රවශීල වත්කම් අගය

| වත්කම්(රු.000) | ජූලි 01 | ජූලි 02 | ජූලි 03 | ජූලි 04 | ජූලි 05 | සාමාන්‍ය අගය* |
|---|---|---|---|---|---|---|
| අතැති මුදල් | 300 | 200 | 110 | 810 | 550 | 394 |
| වා.බැ ජංගම ගිණුම් | 200 | 300 | 250 | 460 | 350 | 312 |
| වා.බැ ස්ථාවර තැන්පතු | 4,000 | 5,000 | 5,000 | 5,000 | 5,000 | 4,800 |
| භාණ්ඩාගාර බිල්පත් | 2,000 | 2,000 | 2,000 | 2,000 | 2,000 | 2,000 |
| අනුමත සමු.සමිති තැන්පත් | 1,000 | 1,000 | 1,000 | 1,000 | 1,000 | 1,000 |
| එකතුව | | | | | | 8,506 |

*දින 05 ශේෂයන්වල එකතුව / 5

මේ අනුව ජූලි මස 05 වැනි දින අවසානයේදී එක් එක් වත්කම් වල සාමාන්‍ය අගය ගණන් බලා සටහන් කර ඇත. එක් එක් දිනයේ පැවති අගය එකතු කර 5 න් බෙදීමෙන් සාමාන්‍යය ලබා ගන්න. දැන් සතිය අගදී සෑම වත්කමකම අගයන් එකතු කල විට රු.8,506,000 ක් ලැබේ. එය ද්‍රවශීලතාවය ගණන් බැලීම සඳහා ජූලි 05 දින අවසානයේදී පැවති ද්‍රවශීල වත්කම්වල අගයයි. මේ අයුරින්ම ජූලි 12 වැනි සිකුරාදා ද්‍රවශීල වත්කම් ගණන් බැලීමේදී සාමාන්‍ය අගය සොයාගත හැක. ඒ සඳහා ජූලි 12 වැනිදා දක්වා පැවති වත්කම්වල සාමාන්‍ය අගය සොයා ගත යුතුය.

මෙහිදී විශේෂ අවධානය යොමු කලයුතු කරුණක් නම් ඇතැම් මූල්‍ය ආයතනවල මුදල් තැන්පත් කිරීම සඳහා සමුපකාර කොමසාරිස්වරුන්ගේ අනුමැතිය ලබා ගතයුතු අවස්ථා වලදී එසේ අනුමැතිය ලබාගත් තැන්පතු පමණක් මෙම ගණනය කිරීම සඳහා ඇතුලත් කළහැකි බවයි. එසේම යම් තැන්පතුවක් හෝ භාණ්ඩාගාර බිල්පතක් සුරැකුම් වශයෙන් තබා ණය පහසුකමක් ලබා ගෙන ඇත්නම් ඒවාද මෙම ගණනය කිරීම සඳහා ඇතුලත් නොකරන්න.

මෙම තොරතුරු අනුව ද්‍රවශීලතා වාර්තාව සම්පූර්ණ කර ඇති අයුරු බලන්න. මෙහිදී සතියේ අවසාන දිනය ජූලි 05 ලෙස සිතාගත් බව සලකන්න. සෙනසුරාදා විවෘතව තබන ආයතන සඳහා ජූලි 06 දා අවසාන දින විය යුතුය.

-------

සමුපකාර සමිතියේ නම :

# ද්‍රවශීලතා වාර්තාව

2013 ජූලි 01 දිනෙන් පටන් ගන්නා සතියේ අවසාන දිනය වන ජූලි 05 වනි දින ද්‍රවශීලතා තත්ත්වය*

( රු. 000 )

| 2013 ජූනි මස 28 වැනි දින | මුළු අගය | තිබිය යුතු ද්‍රවශීල තත්වය |
|---|---|---|
| 1. ඉතුරුම් ගිණුම්වලශේෂයන් | 26 000 | 3 900 |
| 2. ස්ථාවර ගිණුම්වලශේෂයන් | 50 000 | 5 000 |
| 3. එකතුව | 76 000 | 8 900 |

2013 ජූලි 01 දින සිට ජූලි 05 දක්වා පැවති ද්‍රවශීල වත්කම්වල සාමාන්‍ය අගය*

| | | |
|---|---|---|
| 4. අතැති මුදල් | 394 | |
| 5. වාණිජ බැංකුවක ජංගම ගිණුම් බැර ශේෂ | 312 | |
| 6. වාණිජ බැංකුවක හෝ විශේෂිත බැංකුවක ඉතුරුම් ගිණුම් | ................ | |
| 7. වාණිජ බැංකුවක හෝ විශේෂිත බැංකුවක ස්ථාවර තැන්පත් | 4 800 | |
| 8. භාණ්ඩාගාර බිල් පත් /රජයේ සුරැකුම් පත් | 2 000 | |
| 9. පළාත් නියාමන කමිටුවෙන් අනුමත වූ සමුපකාර සමිතියකතැන්පත් | 1 000 | |
| 10. මුළු ගණන | | 8506 |

අතිරික්තය (+) හෝ හිගය (-) -394

ගණකාධිකාරී

.................................................

දිනය..........

බැංකු සේවාකළමණාකරු

.................................

දිනය..........

* අදාල කාලයේ වැඩකල දින ගණන් වල පැවති ශේෂයන් වල එකතුව / මාසයේ වැඩ කළ දින ගණන